## සංක්ෂිප්තය


ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 70%කට වැඩි පිරිසක් ග්‍රාමීය ප්‍රදේශයන් හි ජීවත් වන අතර ඉන් බහුතරයකගේ ජීවනෝපාය මාර්ගය වන්නේ කෘෂිකර්මාන්තය යි. මෙහි දී, වගා කරන බෝගයන් අතර වී වගාවට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. මෙලෙස කෘෂි ආර්ථිකයකට හිමිකම් දක්වන, ශ්‍රී ලංකා ආර්ථිකය ක්‍රමයෙන් කාර්මිකරණ රටාවක් කරා යොමු වීමේ දී නව යන්ත්‍ර සූත්‍ර භාවිතය හා නවීන තාක්ෂණ ක්‍රමවේදයන් අනුගමනය කිරීමේ ප්‍රවනතාවයක් වර්තමානයේ දක්නට ලැබෙයි. මෑතක සිට ගොයම් කැපීම, පෑගීම සහ සුළං කිරීම එකවර සිදුකරන යන්ත්‍ර භාවිතය තුළින් වඩාත් කාර්යක්ෂම අස්වනු සැකසීමේ කාර්යයන් සිදු කෙරෙන ඇති අතර යන්ත්‍ර භාවිතය වී වගාවට නව කාල පරිච්ඡේදයක් උදාකරලීමට සමත්ව තිබේ.

වර්තමාන රජය 'මහින්ද චින්තන' ප්‍රතිපත්ති ප්‍රකාශය මත පදනම් වෙමින් "කෘෂිකර්මාන්තයට නව තාක්ෂණය හඳුන්වාදීම සහ කෘෂිකර්මය ආශ්‍රිත නිෂ්පාදන සඳහා දිරිදීම මගින් කෘෂිකර්මය නව යුගයකට ගැලපෙන ලෙස විවිධාංගීකරණය කරනු ලබන බවට අවධාරණය කර නව තාක්ෂණ ක්‍රමවේදයන් වර්ධනය කරලීම සඳහා සක්‍රිය ලෙස දායක වී ඇත. එවන් පසුබිමක් යටතේ ආරම්භ කළ මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ "වී වගාවේ අස්වනු නෙළීමේ අදියරේ සිට සිදුවී ඇති යාන්ත්‍රීකරණය ගොවි සමාජය වෙත සමාජ, ආර්ථික හා පාරිසරික ලෙස බලපා ඇති ආකාරය විමර්ශනය කිරීමයි.

මෙම අධ්‍යයනය හම්බන්තොට, පොළොන්නරුව හා අම්පාර යන දිස්ත්‍රික්කයන් හි, ගොවිජන සේවා මධ්‍යස්ථාන හයක් ආවරණය වන පරිදි - දත්ත රැස්කර ගන්නා ලදී. "බහු පියවර නියැදි ක්‍රමය" අනුව නියැදිය තෝරා ගත් අතර අදාළ ගොවිජන සේවා මධ්‍යස්ථාන තුළින් තෝරාගත් ගොවීන් 311 දෙනෙකු වෙත ඉදිරිපත් කරන ලද ව්‍යුහගත ප්‍රශ්නාවලියක් මාර්ගයෙන් ප්‍රාථමික දත්ත සපයා ගැණින. ද්විතියික දත්ත සාහිත්‍ය විමර්ශනය තුළින් හා ක්ෂේත්‍රයට අදාළ නිලධාරීන්ගෙන් ලබා ගන්නා ලදී. මෙම අධ්‍යයනය සඳහා ක්ෂේත්‍ර තොරතුරු 2010 ජූලි මස සිට 2010 සැප්තැම්බර් මස දක්වා රැස් කරන ලදී. මෙම අධ්‍යයනයේ දී සංයුක්ත අස්වනු නෙලන යන්ත්‍රය, කුඩා සංයුක්ත අස්වනු නෙලන යන්ත්‍රය, සංයුක්ත අස්වනු පෑගීමේ යන්ත්‍රය සහ ඇග්‍රිමෙක් යන්ත්‍රය යන අස්වනු නෙළීමේ සිට භාවිතා කරන සියලුම යන්ත්‍ර තුළින් සිදුවන වාසි සහ අවාසි සහගත තත්ත්වයන් පිළිබඳ විමසීමට ලක් කරන ලදී.

සෑම දිස්ත්‍රික්කයක් තුළින් ම සංයුක්ත අස්වනු නෙලන යන්ත්‍රයට යොමුවීමේ වැඩි ප්‍රවනතාවයක් විය. මෙම යන්ත්‍රය යොදා ගැනීමට නොහැකි ස්ථානවල පිළිවෙළින් සංයුක්ත අස්වනු පෑගීමේ සහ අනෙකුත් යන්ත්‍ර යොදා ගෙන තිබුණි. සංයුක්ත අස්වනු නෙලන යන්ත්‍රයට යොමු වීමට සමස්ත නියැදිය සැලකුවිට ප්‍රදේශය තුළ ශ්‍රම හිඟයක් පැවතීම (93%), ශ්‍රම වියදමට සාපේක්ෂව අවම මිලක් වැයවීම (85%), අඩු කාලයක් ගතවීම (100%) යන හේතු බලපා තිබුණි. මෙම යන්ත්‍රය නිසා සිදුවන හානි පිළිබඳ ගොවි ප්‍රතිචාර සැලකීමේ දී යන්ත්‍රය නිසා පොළව කැඳවීම (71%), අස්වැන්නේ තෙත ගතියක් පැවතීම (90%) හා යන්ත්‍රය නිසා අස්වනු හානි (80%) සිදුවන බව යනාදී කරුණු රැසක් හෙළි විය. අක්කරයක ප්‍රමාණයක් අස්වනු නෙළීමේ දී බුසල් 5-10 ක් දක්වා ප්‍රමාණයක් අස්වනු හානි සිදුවන බව 85%ක් ගොවීන්ගේ ප්‍රතිචාර යයි. වසරින් වසර මෙම යන්ත්‍රයේ අය කරන මිල ඉහළ යාම ද ගොවීන්ට ගැටලුවක් වී තිබුණි.

සංයුක්ත කොළ මඩින යන්ත්‍රයට යොමුවීමේ දී ශ්‍රම හිඟයක් පැවතීම (70.5%), ශ්‍රමයට සාපේක්ෂව අවම මිලක් (63.4%) හා අඩු කාලයක් ගතවීම (57.1%) බව ගොවි ප්‍රතිචාරයන් හි සඳහන් විය. ඉහත සංයුක්ත අස්වනු නෙලන යන්ත්‍රයට වඩා අඩු ප්‍රතිචාර සංඛ්‍යාවක් සංයුක්ත කොළ මඩින යන්ත්‍රයට යොමුවීමේ දී සටහන් විය. සංයුක්ත කොළ මඩින යන්ත්‍රය නිසා කිසිදු ආකාරයකට පොළවට හානියක් සිදු නොවන අතර යන්ත්‍රය නිසා අස්වනු හානි සිදුවන බව සමස්ත

නියැදියේ 50.9%ක් ගොවීන්ගේ මතය විය. අස්වැන්නේ හා යන්ත්‍රයේ කොටස් ගෙවීම නිසා හානි සිදුවන බව ද හෙළි විය. මේ යන්ත්‍රය නිසා විශාල පරිසර හානියක් සිදුවන බව 64.3 %ක් ගොවීන්ගේ ප්‍රතිචාර යයි.

කුඩා සංයුක්ත අස්වනු නෙළීමේ යන්ත්‍රයට (2W) යොමුවීමට ප්‍රධාන හේතුව වූයේ, ශ්‍රම හිඟයක් පැවතීමයි. සාපේක්ෂව අඩු මිලක් වැය වුව ද, විශාල කාල පරාසයක් අස්වනු නෙළීම සඳහා ගතවීම ගැටලුවක් විය. මෙම යන්ත්‍රය තුළින් ද අස්වනු නෙත ගතිය පවතින බව සඳහන් කරමින් ගොවි හු ප්‍රතිචාර දැක් වූහ.

ඇග්‍රිමෙක් යන්ත්‍රයට යොමුවීමේ දී අධික මඩ සහිත ගොයම වැටී ඇති කුඹුරුවල විශාල යන්ත්‍ර යෙදීම නොහැකි නිසා මේ යන්ත්‍රයට යොමු වූ බවට ගොවි ප්‍රතිචාර දැක්විය. විශේෂයෙන් බීජ වී සඳහා යොමු වූ ගොවි හු මේ යන්ත්‍රය භාවිතා කිරීම වැඩියෙන් සිදු කළ හ.

සමස්තයක් ලෙස ඉහත යන්ත්‍ර තුළින් විවිධ ආකාරයේ වාසි හා අවාසි සහගත තත්ත්වයක් මතුවී ඇත. සංයුක්ත අස්වනු නෙළන යන්ත්‍රයට හා සංයුක්ත කොළ මඩින යන්ත්‍රය (සුනාමි) නිසා ගෘහනියන්ගේ කාර්යයන් සැලකිය යුතු වෙනසක් සිදු වී ඇති අතර හා තරුණ කොටස් මේ යන්ත්‍ර නිසා කෘෂිකර්මාන්තය වෙත යොමු වීමත් පැහැදිලි විය. මෙම යන්ත්‍ර තුළින් නිෂ්පාදිත බීජ භාවිතයේ දී ගැටලුකාරී තත්ත්ව මතු වී ඇති අතර අස්වනු ගබඩා කිරීමේ දී නෙත ගතිය වැනි ගැටලු මතු ව තිබේ. අස්වනු අලෙවියේ දී මෙම නෙත ගතිය ලැබෙන මිල කෙරෙහි බලපෑමක් සිදු කොට ඇත.

තවදුරටත් මෙම නව තාක්ෂණ උපකරණ භාවිතය නිසා සමාජීය, ආර්ථික හා පාරිසරික වශයෙන් බලපාන කරුණු රාශියක් පිළිබඳ කරුණු විමසා තිබේ. පවතින තත්ත්වය විමර්ශනයේ දී පැහැදිලි වූයේ අනාගතයේ දී තවදුරටත් මෙම නව තාක්ෂණ යන්ත්‍ර කෙරෙහි යොමුවීමේ ඉහළ ප්‍රවනතාවයක් පවතින බවකි. මේ තත්ත්වය නිසා කන්නයෙන් කන්නය ඉහළ යන යන්ත්‍ර මිල කෙරෙහි අවධානය යොමු කල යුතු ය. යන්ත්‍රය කුඹුරට යොදන වේලාව හා අවසන් වන වේලාව පිළිබඳ සැලකිලිමත් විය යුතු ය. පවතින පාරිසරික ගැටලු විසඳීම සඳහා සැලසුම්සහගත වත්මන් වැඩ පිළිවෙලක අවශ්‍යතාව පවතින අතර ගොවි පවුල් තුළින් ඉතිරිවන කාලය, ආර්ථික ඵලදායී කාර්යයක යෙදවීමට කටයුතු කළ යුතු ය. නව ද, සංස්කෘතිකමය වශයෙන් ගිලිහී යන ගොයමේ චාරිත්‍ර වාරිත්‍ර කිසියම් මට්ටමකට හෝ අවම කරමින් පවත්වා ගැනීමට කටයුතු කළ යුතු අතර එය අනාගත පරම්පරාවට දායාදයක් ලෙස රැක ගත යුතු ය.

මෙම ගැටලු විසඳීම සඳහා ගන්නා ප්‍රයත්නය, කෘෂි ක්ෂේත්‍රයට නව තාක්ෂණය හඳුන්වාදීම තුළින් නව යුගයකට ගැලපෙන අයුරින් ඉදිරියට ගෙන යාමේ **'මහින්ද චින්තන සංකල්පය'** මල්ඵල ගැන්වීමට හේතු වනු නො අනුමාන ය.